www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සිඩ්නි නගරයේ වර්ගවාදී ප්‍රචණ්ඩත්වය: ශ්‍රී ලංකාවෙන් අනතුරු හැඟවීමක්

## Sydney's racial violence: a warning from Sri Lanka

**විජේ ඩයස් විසිනි**

**2005 දෙසැම්බර් 23**

දෙසැම්බර් මස 11 වන දින සිඩ්නි නගරය අවට ප්‍රදේශවල පුපුරා ගිය වර්ගවාදී ප්‍රචණ්ඩත්වය බරපතල අනතුරු ඇඟවීමක් ලෙස ඕස්ට්‍රේලියානු සහ ජාත්‍යන්තර කම්කරු පන්තිය විසින් අවබෝධ කර ගත යුතුව ඇත. ඔවුන්ගේ පසුබිම කුමක් ද යන්න නොසලකා සමස්ත වැඩ කරන ජනතාවගේ ම ප්‍රජාතන්ත්‍ර අයිතීන් විනාශ කිරීමේ දේශපාලන සංස්ථාපිතයේ පලල් න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම සඳහා ඉතා පහත් වර්ගවාදී හැඟීම් අවුස්සන්නේත්, ප්‍රයෝජනයට ගන්නේත් කෙසේද යන්න එදින සිදුවීම් මනාව පැහැදිලි කරයි.

උතුරු කොනුයුලා වෙරලේ ජීවිතාරක්ෂක කටයුතුවල නිරතව සිටි ලෙබනන් සම්භවයක් ඇති තරුනයකු හා සම්බන්ධ හුදෙකලා සිද්ධියක් මැදපෙරදිග පෙනුමක් ඇති ඕනෑ ම පුද්ගලයකුට එරෙහිව වර්ගවාදී ප්‍රචණ්ඩත්වය ඇවිලවීම දක්වා වූ අනපේක්ෂිත පරාසයකට පුපුරුවා හරින ලදි. මෙය නිතැතින් ම සිදුවූ පුපුරා යාමක් නො වේ. මුල් සිද්ධියෙන් පසු සතියේ, අප බොහෝ අවස්ථාවල ශ්‍රී ලංකාව තුල අත් දැක ඇති ආකාරයට ම දක්ෂිනාංශික මාධ්‍ය විශ්ලේශකයින් විසින් විෂ ඝෝර වර්ගවාදී කල්ලියක් මතුපිටට ගෙන ඒම සඳහා අවශ්‍ය වේදිකාව සැකසීමේ වර්ගවාදී උන්මත්තක වාතාවරනයක් නිර්මානය කරන ලදි.

මෙහි ප්‍රධාන අර්ථලාභියා කවරෙක් ද? ඒ අන් කිසිවකු නොව තමන්ගේ ම මර්දනකාරී සමාජ ආර්ථික වැඩපිලිවෙල වෙතින් වෙනතකට අවධානය යොමු කරවීම සඳහා සංක්‍රමනිකයන්ට එරෙහි හැඟීම් අවුලුවාලීම හා ත්‍රස්ත ප්‍රහාරයන් පිලිබඳ භීතිකාව නිර්මානය කිරීම සම්බන්ධව කුප්‍රකට අගමැති ජෝන් හොවාර්ඩ් සහ ඔහුගේ ලිබරල් ආන්ඩුවයි.

හොවාඩ්ගේ සියලු ප්‍රතිපත්තිවල පාපකාරී සහායකයෙකු වන ලේබර් පක්ෂය තමන් බලයේ සිටින එන්.එස්.ඩබ්ලිව්. රාජ්‍ය ව්‍යවස්ථා ආයතනය හරහා මර්දනකාරී නව පොලිස් බලතල නීති ගත කර ගැනීම සඳහා එකෙනෙහිම මෙය අවස්ථාවක් කර ගත්තේ ය. කොලඹ නගරයේ ඉතා සුලභ දර්ශනයක් වන මාර්ග බාධක, වාහන පරීක්ෂන, අනන්‍යතා පරීක්ෂන සහ අත්තනෝමතික රඳවා තැබීම්, පසු ගිය සති අන්තය සිඩ්නි නගරයේ පදිංචිකරුවන්ට හඳුන්වා දෙන ලදි.

ඕස්ට්‍රේලියා රාජ්‍ය යන්ත්‍රය ශක්තිමත් කිරීමේ මෙම ද්විපාර්ශවීය පෙරමුන ලෝකය පුරා ම සෑම ධනපති ආන්ඩුවක්ම පිලිගත් ආදර්ශයක් බවට පත් වී ඇත. මෙයින් වෙනත් කිසිම කරුනකින් ප්‍රකාශවනවාට වඩා පැහැදිලිව ප්‍රකාශිත වන්නේ මානව වර්ගයා මුහුන දී ඇති සමාජ සහ දේශපාලන අර්බුදයේ ජාත්‍යන්තර ස්වරූපයයි. ධනවත් අතලොස්සකගේ යහපත පිනිස වන ප්‍රතිපත්තිවලට මහජන සහාය දිනා ගැනීමේ නොහැකියාවෙන් පෙලෙන ආන්ඩු තම දින චරියාව ලෙස අසත්‍යයන් මතත්, ප්‍රතිගාමී ප්‍රකෝපකාරිත්වය මතත් ප්‍රජාතන්ත්‍ර විරෝධී නීති පැනවීම මතත් පිහිට පතති.

උතුරු කොනුයුලාවේ කැරැල්ලට පසු හොවාඩ් කල විස්තර ප්‍රකාශය මෙම තත්වයේ විශේෂ හෙලිදරව්වකි. ප්‍රචණ්ඩකාරී කල්ලියේ හැඟීම් සම්බන්ධව සානුකම්පිකව හොවාඩ් ප්‍රකාශ කලේ "ඕස්ට්‍රේලියානුවන්ට ගෝත්‍රවාදය අවශ්‍ය බව මා සිතන්නේ නැත. ඔවුන්ට අවශ්‍යවන්නේ අප සියල්ලන්ම ඕස්ට්‍රේලියානුවන් වීමයි." වෙනත් වචනවලින් කිව හොත් ප්‍රචණ්ඩකාරිත්වය පුපුරා යෑමේ වරද පැටවෙන්නේ ඕස්ට්‍රේලියාවට ගැලපෙන පරිදි අනුගත වීමට මැදපෙරදිග සංක්‍රමනිකයන්ගේ නොහැකියාව මතයි.

හොවාඩ්ගේ වචන ඇසුනුවිට ශ්‍රී ලාංකික සමාජවාදියෙකු ලෙස මට මතකයට නැගුනේ අවුරුදු 22කට පෙර මෙහි සිදුවූ සිදුවීම් ය. 1983 ජුලි මස 23 වන දිනෙන් පටන්ගෙන දින 3ක් රාජ්‍ය අනුග්‍රහය ලත් මැරවරයින් වගක් තුගක් නැතුව දෙමල ජාතිකයන්ට පහර දීමත් සමග දිවයින පුරා වර්ගවාදී ජන සංහාරය පුපුරා ගියේ ය. සිය ගනන් මිනිසුන් මරා දමන ලද අතර ඩොලර් දස දහස් ගනන් වටිනා ව්‍යාපාර සහ ගෙවල් දොරවල් ගිනි තබන ලදි.

දශක දෙකකට අධික කාලයක් මුලු රටම ගොදුරු කර ගත් සිවිල් යුද්ධයට ඉතා ආසන්නව ප්‍රාරම්භය වූයේ මෙම වර්ගවාදී ජන ඝාතනයයි. දසදහස් ගනන් ජනතාව මරනයට ගොදුරු වූ අතර උතුරු නැගෙනහිර

යුද කලාපයේ විශාල ප්‍රදේශ සුන් බුන් බවට පත් විය. දින තුනක් තිස්සේ සිංහල වර්ගවාදී ප්‍රචන්ඩකාරී කල්ලි කන්ඩායම්වලට වීදි පාලනය කිරීමට ඉඩ දීමෙන් පසු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන තම ජාතිය ඇමතීමේ කථාවෙන් ජනඝාතනය හා විනාශය සාධාරනීකරනය කලේ ය. පැහැදිලිව ම හොවාඩ්ගේ වචනවලට සමාන වචන පාවිච්චි කරමින් ඔහු ප්‍රකාශ කලේ "වසර 2000කට වඩා අධික ඉතිහාසයකට උරුමය ඇති සිංහල ජනතාව රට බෙදීමට විරුද්ධ" බව ය.

"සිංහල ජනතාවගේ අභිලාශයන්ට අනුකූලව අප තීරනය කර තිබෙන්නේ බෙදුම්වාදය සඳහා කරනු ලබන සියලු ම ප්‍රචාරක කටයුතු නීතියෙන් තහනම් කිරීම සඳහා පාර්ලිමේන්තු පනතක් සම්මත කර ගැනීමට යි." ඔහු තව දුරටත් පැවසී ය.

මෙසේ සාහසික මනුෂ්‍ය සංහාරය සම්බන්ධ වරද කෙලින් ම සංහාරයට ගොදුරු වූවන් මත ම පටවන ලදි. දෙමල බෙදුම්වාදය සඳහා කරනු ලබන ඉල්ලීම සිංහල ස්වෝත්තමවාදීන් ආධිපත්‍යය දරූ ආන්ඩු විසින් දශක ගනනාවක් තිස්සේ ඉදිරියට ගෙනයන ලද දෙමල විරෝධී විෂම ලෙස සැලකීම්වලත් පීඩනයේත් ප්‍රතිඵලයක් ය යන කාරනය ඉතා පහසුවෙන් පාපිස්න යටට අතුගා දැමී ය.

අගෝස්තු මස 4 වන දින ජයවර්ධන විසින් හදිසි අවශ්‍යතාවයක් යන පදනම මත විවාදය සහ සාකච්ඡාව සඳහා පැය 13ක කෙටි කාලයක් පමනක් වෙන් කරමින් ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනය පාර්ලිමේන්තුව තුලින් සම්මත කර ගත්තේ ය.

සියලු ම පාර්ලිමේන්තු මන්ත්‍රීන් "ඒකීය රාජ්‍යයට පක්ෂපාතිත්වය ප්‍රකාශ කිරීමේ දිවුරුමකට බැඳ තැබීමේ වගන්තියක් එහි අන්තර්ගත කලේ ය. ප්‍රධාන පාර්ලිමේන්තු විරුද්ධ පක්ෂය වූ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුන (ටීයූඑල්එෆ්) මෙම දිවිරීම ප්‍රතික්ෂේප කිරීමේ හේතුවෙන් ඔවුන්ගේ ආසන අහිමි කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ඡන්ද බලය අහිමි වූ දෙමල තරුනයෝ රටේ උතුරු නැගෙනහිරට වෙන ම දෙමල ජාතික රාජ්‍යයක් යන ඉල්ලීම නිකුත් කල ධනපති ජාතික ව්‍යාපාරයක් වන දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය වටා එක් රොක් වූහ.

ගැඹුරු වෙමින් පවතින සමාජ ආර්ථික අර්බුදයට සිංහල පාලක ප්‍රභූවේ ප්‍රතික්‍රියාව වූයේ ජන සංහාරය යි. ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (අයිඑම්එෆ්) නිදහස් වෙලඳපොල ප්‍රතිපත්තීන් වැලඳගත් දකුනු ආසියාවේ පලමු වන රට වූයේ ජයවර්ධන යටතේ ශ්‍රී ලංකාවයි. පැතිරෙමින් පැවති පන්ති අරගලවලට මුහුන දීමට සූදානම්වීම් වශයෙන් ඉතා පුලුල් බලතල සහිත විධායක ජනාධිපති තනතුර ස්ථාපිත කිරීම සඳහා ඔහු විසින් 1978 දී ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කලේ ය. 1980 තම ජීවන තත්වයන් රැකගැනීම සඳහා පාර්ශ්වීය මහා වැඩ වර්ජනයකට සහභාගි වීමේ වරදට ලක්ෂයකට අධික කම්කරුවන් එකෙනෙහිම සේවයෙන් පහ කරන ලදි.

සේවයෙන් නෙරපන ලද කම්කරුවන් යලි සේවයේ පිහිටුවීමේ සහ ආන්ඩුවේ ආර්ථික ප්‍රතිව්‍යුහකරන න්‍යාය පත්‍රයට අභියෝග කරන අරගලවලට එලඹීම 1983 වන විට කම්කරු පන්තිය විසින් ආරම්භ කරමින් පැවතුනි. පෞද්ගලීකරනය නතර කිරීම, දෙමල කථා කරන වතු කම්කරුවන්ට පූර්න පුරවැසි අයිතිය, ත්‍රස්තවාදී මර්දන පනත අහෝසි කිරීම, දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම සහ නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කිරීම යන ඉල්ලීම් ඇතුලත් ඉල්ලීම් 11ක් වටා වෘත්තිය සමිති 28ක් ඒකරාශී විය.

ජයවර්ධන සහ ඔහුගේ එක්සත් ජාතික පක්ෂය (යූඑන්පී) මෙම දෙමල විරෝධී සංහාරය මුදා හැරියේ, වෘත්තිය සමිති 28ක් එක් රැස්වී මෙම ඉල්ලීම් අනුමත කර ගැනීමෙන් හරියට ම දින 6කට පසුව ය. එජාප මැරයින් ප්‍රචන්ඩ ක්‍රියා ඉදිරියට ගෙන යමින් සිටිද්දී යුද හමුදාව සහ පොලීසිය පසෙකට වී බලා සිටියහ. ආන්ඩුවේ කම්කරු පන්ති විරෝධී ප්‍රතිපත්ති සහ වර්ගවාදී ප්‍රකෝපකාරීත්වය අතර ඍජු සම්බන්ධතාවය පැහැදිලිව ප්‍රදර්ශනය විය.

වර්ගවාදී වෙනස්කම් කිරීම තම සතුරා වන කම්කරු පන්තිය බෙදා වෙන් කොට තම පාලනය තුල තබා ගැනීම සඳහා පාවිච්චි කරන ලද ඉපැරනිම ආයුධවලින් එකකි. සමාජයේ අතිමහත් බහුතරය අනාථ භාවයට ඇද හෙලමින් මහ ධනසම්පත් සුලුතර පිරිසක් අත ගොඩ ගැසෙමින් සමාජ ධ්‍රැවාන්ත ගතවීම ඩබාත් තියුනුවත්ම මෙම ප්‍රතිගාමී ආයුධය වඩ වඩා ප්‍රයෝජනයට ගනු ලබයි.

දරිද්‍රතාවයේ ගිලී ඇති ඉන්දියානු උප මහාද්වීපය එහි පංගුවට වඩා වැඩි ප්‍රමානයකින් වාර්ගික ප්‍රචන්ඩත්වයෙන් පීඩා විඳ තිබේ. ඇත්ත වශයෙන් ම දෙවන ලෝක යුද්ධයෙන් පසු ගොඩ නැගුනු ජාතික රාජ්‍ය ආරම්භයේ සිට ම වර්ගවාදී මඩ ගොහොරුවේ ගිල්ලවී ය.  ස්වදේශීය පාලක පන්තීන්ගේ පිටුබලය ලත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය විසින් දකුනු ආසියාව මුස්ලිම් පකිස්ථානයක් සහ හින්දූන් ප්‍රබල ඉන්දියාවක් ලෙස කොටස්වලට කඩා සියදහස් ගනන් ජීවිත බිලිගත් වර්ගවාදී සමූල ඝාතනයක් මුදා හලේ ය. කුඩා දූපතක් වන ශ්‍රී ලංකා රාජ්‍යය ගත්විට එය මුල පටන් ම සිංහල ස්වාධිපතිත්වය මත පදනම් විය. ශ්‍රී ලංකාව නිර්මානය කොට පිහිටුවන ලද 1948 වර්ෂයේ දී ම එජාප ආන්ඩුව විසින් සමස්ථ ජනගහනයෙන් 1/10ක් වූ දෙමල කථා කරන වතු කම්කරුවන්ගේ පුරවැසි අයිතිය අහිමි කරන ලදි.

ඕස්ට්‍රේලියාවට වඩා වෙනස් ආකාරයක ඉතිහාසයක් තිබුනේ වී නමුදු ආරම්භයේ සිට ම වර්ගවාදය ජාතිවාදය

සමග එකට වෙලී පැවතිනි. ඕස්ට්‍රේලියාවේ බල පැවැත්වෙන වාර්ගිකත්වය මත විෂම ලෙස සැලකීමේ ආගමන විගමන ප්‍රතිපත්තීන් ආසියාව පුරා ම කුප්‍රකට ය.

පශ්චාත් යුදකාලීන උත්පාත සමයේ දේශපාලනඥයින් සහ මාධ්‍ය පන්ඩිතයින් එයට "වාසනාවන්ත රට" යන නමින් ඇමතීමට ඇලුම්කලද දසලක්ෂ සංඛ්‍යාත ඕස්ට්‍රේලියානුවන් අද ජීවත් වන්නේ දරිද්‍රතා රේඛාවටත් පහලිනි. වර්ගවාදී ප්‍රචන්ඩත්වයේ පිහිට පැතීම හැමවිට ම අතිශය උත්සන්න වූ සමාජ ආතතියේ සලකුනකි. සමහරවිට ඕස්ට්‍රේලියාව ශ්‍රී ලංකාව හා සැසඳීම අනුචිත ලෙස පෙනී යා හැකි වුවද වර්ගවාදයේ එයට ම නෛසර්ගික වූ භයානක සිද්ධාන්තයක් අන්තර් ගත වන අතර ඕස්ට්‍රේලියාව තුල සිටින වැඩ කරන ජනතාවට තමන් ශ්‍රී ලංකා මාර්ගය දිගේ ගසාගෙන යන බව අවබෝධ කර ගැනීමට වැඩි කල් ගත නොවනු ඇත.

"ජනතාව පලල් ප්‍රජාවක් තුලට සංගටනය වීම කෙරෙහිත් අප තුල ගෝත්‍රවාදය වැලැක්වීම කෙරෙහිත් අපි දැඩි ලෙස අවධාරනය කරමු". හොවාඩ් පවසයි. එන්එස්ඩබ්ලිව් අගමැති මොරිස් ලෙමා මෙලෙස පවසමින් හොවාඩ්ව දෝංකාර නන්වයි. "අප දැක ඇති ආකාරයේ හැසිරීම් රටාවක නිරතව සිටීම අවශ්‍යව ඇති අපරාධකරුවන් හා අමනයින් විසින් 'අගති රහිත' සහ 'දිදුලන' ජාත්‍යන්තර නගරයක් ලෙස සිඩ්නි නගරයට ඇති කීර්ති නාමය කෙලෙසීමට මම ඉඩ නොදෙමි."

වර්ගවාදී දේශපාලනයේ පාවිච්චි වන සංකේත වචනවලට හුරු පුරුදු ඕනෑ ම පුද්ගලයෙකුට මෙම විස්තර ප්‍රකාශයන් හා අගති රහිත වීම අතර කිසි ම ආකාරයක සම්බන්ධතාවයක් නැති බවට මෙම විස්තර ප්‍රකාශය ම ප්‍රත්‍යක්ෂ කරයි. "ගෝත්‍රය" සහ "අමනයින්" කවුරුන්ද යන්න ඉතා පැදිලි ය. මෙම සඳහන් කිරීම් " ලෙබ්ස්" සහ "වොග්ස්" අවඥාසහගත නම්වලින් තමන් විසින් හඳුන්වනු ලබන ජන කොටස්වලට හිරිහැර කිරීමටත්, ඔවුන් තැති ගැන්වීමටත්, විනාශ කිරීමටත් පොලිස් බලකායන් තුල සිටින්නවුන් ද ඇතුලු සියලු ම වර්ගවාදී තක්කඩින්ට කරන ලද ආරාධනයක් විය. මෙය වර්ගවාදී ගැටුම්වල කථාවයි.

ශ්‍රී ලංකාවේ අත්දැකීම් තුලින් වැඩිදුර පාඩමක් උකහාගත යුතුව ඇත. එනම් 'වර්ගවාදය' හිංසනයට පත් කොට ඇති සුලු ජන කොටස්වලටත් තිබෙන පිලිතුර ද නොවන බවයි. කොයි ආකාරයක හෝ අනන්‍යතා දේශපාලනය අධිවාමනය කරන (හුවා දක්වන) ආගමික හෝ ප්‍රජා නායකත්වයන් වටා ඒකරාශී වීම තුලින් ඕස්ට්‍රේලියානු සංක්‍රමනීය කම්කරුවන්ට හෝ තරුනයන්ට තම අයිතීන් ආරක්ෂා කර ගත නොහැකි ය. ශ්‍රී ලංකාව තුල හිංසනයට හා විෂම සැලකීමට එරෙහිව සටන් වැදීම සඳහා එල්ටීටීඊයට සම්බන්ධ වී ඇති දෙමල තරුනයින් සම්පූර්න අපාරයකට මෙහෙය වී ඇත. එල්ටීටීඊයේ ඉල්ලීම් දරිද්‍රතාවයට පත් දෙමල පීඩිතයින් නියෝජනය නොකරන අතර ඒවා නියෝජනය කරන්නේ දෙමල ධනපති පන්තියේ අවශ්‍යතාවන් ය.

පිලිතුර ඇත්තේ වර්ගවාදය මත නොව, තමාගේ ආගම, හමේ පැහැය, භාෂාව, වාර්ගිකත්වය කුමක් වුව ද සියලු ම කම්කරුවන් පොදු සතුරකුට එනම් ලාභ ඉපයීමේ පද්ධතියට මුහුන දී ඇති බව හඳුනා ගැනීම මත පදනම් වන පන්ති විසඳීමක් මතයි.

බහුතර ජනතාවගේ දැවෙන අවශ්‍යතාවන් දිනා ගැනීම සඳහා සමාජය සමාජවාදී ප්‍රති ව්‍යුහගත කිරීමක් සඳහා කම්කරු පන්තිය ජාත්‍යන්තරව පුරෝගාමී කර්තව්‍යය ඉටු කරමින් සටන් නොකල හොත් පාලක පන්තිය, එය ලෙබිස්වරුන්ට එරෙහිව ඕස්ට්‍රේලියානුවන් වුවද, දෙමල ජනයාට එරෙහි සිංහලයින් වුවද, භාතෘඝාතක ආරවුල් ඇවිලවීම දිගට ම කර ගෙන යනු ඇත.

භූගෝලකෘත ධනවාදය බිඳ හෙලීම ලෝක සමාජවාදය ගොඩනැගීමෙන් මෙපිට වෙනත් කිසිවකින් සිල්ලන්ට ම යහපත් ජීවන තත්වයක් සහ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහතික කිරීමක් සිදු කල නොහැකි වනු ඇත. ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ අපගේ සහෝදරයින් සමගත් ලෝකය පුරා හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සෙසු කොටස් සමගත් ඒකාබද්ධ වී ශ්‍රී ලංකාවේ සසපයේ අප සටන් කරන්නේ ඒ වෙනුවෙනි.

© www.wsws.org